# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 49 දරන
# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1985 දෙසැම්බර් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිළ : ශත 60 යි තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1985 අංක 49 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 දෙසැම්බර් මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 44/84

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1985 අංක 49 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 18 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— 1979 අංක 15 දරන පනතෙහි 18 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ප්‍රජා සේවා ආඥා.

18. (1) අධිකරණය විසින්, යම් චූදිත තැනැත්තකු වරදකරු කොට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට හෝ දඩයක් ගෙවීම පැහැර හැරීමේ දී චූදිත තැනැත්තකුට බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් කිරීම වෙනුවට (මෙහි මින් මතු "ප්‍රජා සේවා ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමිත ආකෘතියක වූ ආඥාවක් සටහන් කිරීමෙන්, එකී චූදිත තැනැත්තා විසින්, නම් කරන ලද ස්ථානයක දී,—

(අ) රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන හෝ ව්‍යාපෘතියක ;

(ආ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ යම් පළාත් පාලන ආයතනයක ; හෝ

(ඇ) අවස්ථාවෝචිත පරිදි යම් පුණ්‍යායතනයක්, සමාජ සේවා සංවිධානයක් හෝ පූජනීය ස්ථානයක් භාරව සිටින තැනැත්තාගේ කැමැත්ත ඇතිව එවැනි පුණ්‍යායතනයක, සමාජ සේවා සංවිධානයක හෝ පූජනීය ස්ථානයක,

බලයලත් නිලධරයකුගේ විධානය සහ අධීක්ෂණය යටතේ, එම ආඥාවෙහි සඳහන් කරනු ලබන සේවාවක් ඉටු කරනු ලැබිය යුතු යයි විධාන කරනු ලැබිය හැකි ය.

(2) ප්‍රජා සේවා ආඥාවක කාලසීමාව, එම ආඥාව සටහන් කරනු ලබන දිනයෙන් ආරම්භව ඒ ආඥාවෙහි නියමිතව සඳහන් පරිදි, එක් වර්ෂයක් ඇතුළත දී ඉෂ්ට කළ යුතු, නියමිත පැය ගණනක

පැය හතලිහකට අඩු නොවන්නා වූ ද, පැය දෙසිය හතලිහකට වැඩි නොවන්නා වූ ද, පැය ගණන කින් සමන්විත විය යුතු ය.

(3) ප්‍රජා සේවා ආඥාවක් සටහන් කරනු ලැබුවේ යම් වරදකරුවකු කරනු ලැබූ තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තා, තමාට ඉටු කරන ලෙස විධාන කරන ලද සේවය, ආඥාවෙහි සඳහන් පරිදි නියමිත පැය ගණන ඇතුළත දී ඉටු කිරීමට අපොහොසත් වන්නා වූ හෝ, බලය ලත් නිලධරයා සෑහීමට පත්වන පරිදි එම සේවය ඉටු නොකරන්නා වූ හෝ, එම ප්‍රජා සේවා ආඥාව අනුව ක්‍රියා කිරීමට යම් ආකාරයකින් පැහැර හරින්නා වූ හෝ අවස්ථාවක එම ප්‍රජා සේවා ආඥාව සටහන් කළ අධිකරණය විසින්—

(අ) එම ප්‍රජා සේවා ආඥාව වෙනස් කරනු ලැබීම ;

(ආ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ආකාරයට අලුත් ප්‍රජා සේවා ආඥාවක් සටහන් කරනු ලැබීම ; හෝ

(ඇ) එම ප්‍රජා සේවා ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කොට, එම ප්‍රජා සේවා ආඥාව කරන ලද්දේ යම් වරදක් සම්බන්ධයෙන් ද ඒ වරද සඳහා ඔහු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබීම ; හෝ

නීත්‍යානුකූල විය යුතු ය.

(4) වරදකරුවකු කරනු ලැබූ තැනැත්තා විසින් ප්‍රජා සේවා ආඥාවේ කාල සීමාව තුළ දී, එම ප්‍රජා සේවා ආඥාව අනුව කටයුතු කර ගෙන යන්නේ ද, නැතහොත් කටයුතු කර තිබේ ද යන්න සඳහන් කරමින් සේවාවන් ඉටුකිරීම පිළිබඳ වාර්තාවක් බලයලත් නිලධරයා විසින් ප්‍රජා සේවා ආඥාව සටහන් කළ අධිකරණය වෙත එම අධිකරණය විසින් තීරණය කරනු ලබන දිනයක හෝ දිනවල ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් ප්‍රජා සේවා ආඥාව සටහන් කරනු ලැබිය යුතු ආකාරය සහ ප්‍රජා සේවා ආඥා ක්‍රියාවේ යෙදවිය යුතු ආකාරය, නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා "බලයලත් නිලධරයා" යන්නෙන්—

(අ) රජයේ හෝ රජයේ අනුග්‍රහය ලබන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වූ විට එම ව්‍යාපෘතිය භාරව සිටින නිලධරයා ;

(ආ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධ යෙන් වූ විට ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ;

(ඇ) රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සම්බන්ධයෙන් වූ විට එම රාජ්‍ය සංස්ථාවේ හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා ;

(ඈ) පළාත් පාලන ආයතනයක් සම්බන්ධ යෙන් වූ විට එම පළාත් පාලන ආයතනයේ කොමසාරිස්වරයා හෝ ලේකම්වරයා ; සහ

(ඉ) පුණ්‍යායතනයක්, සමාජ සේවා සංවිධානයක් හෝ පූජනීය ස්ථානයක් සම්බන්ධ යෙන් වූ විට, ඒ ආයතනය, සංවිධානය හෝ ස්ථානය භාරව සිටින තැනැත්තා

අදහස් වේ.".